1 වන කාණ්ඩය - 5 වන කලාපය
தொகுதி 1 - இல. 5
**Volume 1 - No. 5**

2017 සැප්තැම්බර් 21 වන බ්‍රහස්පතින්දා
2017 செப்ரெம்பர் 21, வியாழக்கிழமை
**Thursday, 21st September, 2017**

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය

## නිල වාර්තාව

# அரசியலமைப்புச் சபை

## அதிகார அறிக்கை

# CONSTITUTIONAL ASSEMBLY

## OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය

## அரசியலமைப்புச் சபை

## CONSTITUTIONAL ASSEMBLY

***2017 සැප්තැම්බර් 21වන බ්‍රහස්පතින්දා***

*2017 செப்ரெம்பர் 21, வியாழக்கிழமை*

*Thursday, 21st September, 2017*

**පූ.භා.9.30ට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය රැස් විය. සභාපතිතුමා [ගරු කරු ජයසූරිය මහතා] මූලාසනාරූඪ විය.**

அரசியலமைப்புச் சபை மு.ப.9.30 மணிக்குக் கூடியது.

தவிசாளர் அவர்கள் [மாண்புமிகு கரு ஜயசூரிய] தலைமை வகித்தார்கள்.

The Constitutional Assembly met at 9.30 a.m., THE CHAIRMAN [HON. KARU JAYASURIYA] in the Chair.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

වාර්තා පිළිගැන්වීම. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව, එම කමිටුවේ සභාපති ගරු අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා විසින් පිළිගැන්වීම.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்க - பிரதம அமைச்சரும் தேசிய கொள்கைகள் மற்றும் பொருளாதார அலுவல்கள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - Prime Minister, Minister of National Policies and Economic Affairs)

ගරු සභාපතිතුමනි, 2015 ජනවාරි 8 වනදා, ශ්‍රී ලංකාවාසී ජනතාවට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඉදිරිපත් කරන බවට අප දුන් පොරොන්දුව ඉටු කිරීමේ තවත් පියවරක් අද ජාතික ආණ්ඩුව ගන්නවා. අප සකස් කරන්න බලාපොරොත්තු වන්නේ, ජාති, ආගම්, වර්ග හෝ සමාජ පසු බිම් පිළිබඳ භේදයකින් තොර, සියලු ශ්‍රී ලාංකිකයන්ට පොදුවේ ප්‍රයෝජනවත් වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. එය, අප විසින් ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නඟනු ලැබීමෙන් අත්කර ගන්නා ප්‍රගතියේ ප්‍රතිලාභ සියලු ශ්‍රී ලාංකිකයන්ට බෙදී යන බව තහවුරු කරන, නව ප්‍රගතිශීලී වැඩ රාමුවක් අර්ථ දක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්. අප මේ අවස්ථාව යොදා ගත යුත්තේ, අපේ ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීමට හා සාමය හා ස්ථාවරත්වය ගොඩ නඟා ගැනීමටයි. මේවා දශක තුනකටත් වැඩි කාලයක් තිස්සේ අපේ ජාතියට ආගන්තුක වූ දේවල්. ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නැඟීමේ හා සියලුම අයට සමෘද්ධිය තහවුරු කිරීමේ අපේ පොදු අරමුණ සාක්ෂාත් කර ගැනීමට මෙවැන්නත් අත්‍යවශ්‍යයි. රැකියා උත්පාදනයටත්, පෞද්ගලික ආයෝජන ගෙන්වා ගැනීමටත්, සියලු ශ්‍රී ලාංකිකයන්ගේ සමෘද්ධිය වර්ධනය කර ගැනීමටත් අපට ශක්තිමත් ආර්ථිකයක් හා සංවර්ධනයක් අත්‍යවශ්‍යයි.

අද අප සියලුදෙනාටම ඉතා වැදගත් දවසක්. මෙතෙක් කලක් අපව ගැටුම් හා දේශපාලනමය ප්‍රචණ්ඩත්වයෙන් දුෂ්ට චක්‍රයක සිරකර තබා ගනිමින්, අපේ ආර්ථික වර්ධනයට තර්ජනයක් වූ, බෙදුම් හා දුරස්ථභාවයන් දුරු කරන පාලමක් සාදා ගැනීමේ මහඟු අවස්ථාවක් දැන් අපට උදා වී තිබෙනවා. ව්‍යවස්ථා කෙටුම්පතක් සඳහා වන නෛතික ලියවිල්ල සාකච්ඡා කිරීම සඳහා පදනම් කරගත හැකි, මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව දැන් මම **සභාගත*** කරනවා. This is only a basis for discussing a draft Constitution, which finally will have legal effect once enacted.

මෙහි පළමුවැනි පරිච්ඡේදයට, මෙහෙයුම් කමිටුවේ ප්‍රයත්නයන් පිළිබඳව වන මූල ධර්ම හා සූත්‍රයන් අඩංගු වනවා. එම මූල ධර්ම හා සූත්‍රයන් පිළිබඳව මෙහෙයුම් කමිටුවේ සාමාජිකයන් දැක්වූ නිරීක්ෂණ හා විවේචන දෙවන පරිච්ඡේදයේ ඇතුළත්. ඒ කියන්නේ, මේවා ගැන කථා කරගෙන අපි කොහොමද එකඟ වෙන්නේ කියන ගමන්, අපේ විවිධ පක්ෂවලට වුවමනා නම් තමන්ගේ ස්ථාවරයත් අතුරු වාර්තාවට ඇතුළු කරන්න අවස්ථාව දුන්නා. එතැන ඉඳන් තමයි අපි දැන් මේ කාරණයට එක් වෙන්න බලන්නේ. ඒ නිසා බහුතර වාර්තාවක් හෝ සුළුතර වාර්තාවක් අවශ්‍ය වෙන්නේ නැහැ. එවැනි වාර්තාවක් අවශ්‍යයි කියලා මම හිතන්නේ නැහැ. මොකද, අපි සියලුදෙනා එකට එකතු වෙලා තමයි මේ වැඩකටයුත්ත කළේ. කමිටු සාමාජිකයන්ගේ සියලු අදහස් මේ වාර්තාවට ඇතුළත්.

දෙමළ ජාතික සන්ධානය පෙර නොවූ විරූ පියවරක් ඉදිරියට තබමින්, මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාවේ ඇතුළත් කොන්දේසිවලට ජාතික ආණ්ඩුවේ ප්‍රධාන පක්ෂ දෙක එකඟ වන්නේ නම් තමන් ද එකඟ වන්නට කැමැති බව කියා තිබෙනවා. පළමු පරිච්ඡේදයේ, "ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් විය යුතු බව" යෝජනා කොට තිබෙනවා. එමෙන්ම මේ පරිච්ඡේදයේ බලය බෙදා දීමේ මූල ධර්ම ද ඇතුළත් කර තිබෙනවා. මෙම මූලධර්ම සම්බන්ධයෙන් අප තුළ එකඟතාවක් ඇති කර ගන්නේ කෙසේද යන්න පිළිබඳ තීරණයක් ගැනීමේ වගකීම දැන් එක්සත් ජාතික පක්ෂය හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මත පැවරී තිබෙනවා. එවැනි එකඟතාවක් ඇති කර ගැනීමට අපට තිබෙන හැකියාව මතයි මේ රටේ අනාගතය තීරණය කෙරෙන්නේ.

දශක ගණනාවක් තිස්සේ පැවැති ආතතිය හා භේද භින්නවීම් ඉවත දමා, එකඟතාවක් ගොඩනඟා ගැනීමේ අභිලාෂයෙන්, බෙදා වෙන් කළ නොහැකි ඒකීය ශ්‍රී ලංකාවක් පිළිගැනීමට සියලු සාමාජිකයන් සූදානම්. ඒ වාගේම, වැඩිදුරටත් බලය බෙදීමකට ද - maximum devolution of power - සූදානම්. මෙහි පැහැදිලි අරමුණක් වන්නේ ශ්‍රී ලංකාවාසී ජනතාව සාමයෙන් හා එකමුතුකමින් ඇඳ - බැඳ තබන්නට ඇති කැපවීම පෙන්වීමයි. අපි අපේ රටේ දේශපාලන පදනමෙහි ලොකු වෙනසක් අත්දකිමින් සිටිනවා. එනම්, අතීතයේ තිබුණු බෙදුම්වාදී භයානක ස්වරූපයෙන් ඈත්ව අනාගතය කෙරෙහි යොමු වූ නව දිශාවකට ගමන් කිරීමයි. මේ රජය සහය දක්වන්නේ එවැනි වෙනසකටයි.

ගතවූ දශක තුනක කාලය තිස්සේ අපි සිතා ගන්නට බැරි තරම් දුක් පීඩා, කරදරවලින් බැට කෑවා. දැන් පළමු වතාවට අපට එකමුතුව ඉදිරියට ගමන් කළ හැකි පොදු වේදිකාවක් හමු වී තිබෙනවා. පසුගිය අවුරුදු දෙක පුරා මේ රජය රටේ පවතින දේශපාලන, වාර්ගික හා ආගමික ආතතිය ආමන්ත්‍රණය කිරීමට මහත් පරිශ්‍රමයකින් වැඩ කළා. අපි එසේ කළේ අපේ ආර්ථික වර්ධනයට ඒ ගැටලුවලින් විශාල අභියෝගයක් එල්ල වන බව දන්නා නිසයි. සාමය හා ස්ථාවරත්වය ඇති කර ගැනීම සඳහා කෙරෙන මේ නව කැපවීම ශ්‍රී ලංකාවේ මතු -අනාගත- පරපුරට වාසනාවන්ත වෙනසක් ඇති කරාවි. මේ වටිනා අවස්ථාව අපේ දෑතින් ගිලිහෙන්නට ඉඩ දිය නොහැකියි. අප බොහොම වෙනස් ප්‍රවේශයකට පය තබන බව මෙයින් පෙනී යනු ඇතැයි මා බලාපොරොත්තු වනවා. අපේ ප්‍රජාතන්ත්‍රවාදය තුළ වෛරයට

****  පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු රනිල් වික්‍රමසිංහ මහතා]

කිසිදු ඉඩක් නැහැ. ඒ වාගේම අපේ අනාගතයටත් එවැනි ඉඩක් තිබිය නොහැකියි. අපේ රට නැවතත් වෛරී අතීතය කරා ඇද දැමීමට ඉඩ දිය නොහැකියි. ඒ වාගේම අපේ රට, වෛරයෙන් කැබලි කරන්නත් අප ඉඩ දෙන්නේ නැහැ.

අප අග්‍ර ගණ්‍ය, ප්‍රෞඪ බෞද්ධ ජාතියක්. අපේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් මේ තත්ත්වය සුරැකෙනවා. ඒ වාගේම බුද්ධාගමට ඇති ප්‍රමුඛස්ථානය අපේ සමාජය තුළ ආරක්ෂා කෙරෙනවා. ඇත්ත වශයෙන්ම අපේ නව ව්‍යවස්ථාවට පදනම් වන්නේ බෞද්ධ ප්‍රතිපත්ති හා මූලධර්මයි. බුදුරජාණන් වහන්සේ ඉගැන්වූයේ වෛරයෙන් වෛරය නොසංසිඳෙන බවයි; අවෛරයෙන් වෛරය ජයගත යුතු බවයි. අද අප ඉටු කර ගන්න බලාපොරොත්තු වන අරමුණෙහි හරය එයයි. ඒ වාගේම ඉදිරියේදීත් අපේ ජාතියට මඟ පෙන්වීම සඳහා මේ බෞද්ධ ඉගැන්වීම් කෙරෙහි අප විශ්වාසය තබනවා. නැති ප්‍රශ්න ඉස්මතු කරමින්, අනවශ්‍ය බියක් ඇති කරමින්, ආර්ථිකය විනාශ කරමින්, ජනතාව බෙදා වෙන් කිරීමට අප ඉඩ දෙන්නේ නැහැ. අද අප ඔබ වෙත පැමිණ සිටින්නේ විසඳුමක් සමඟයි. මේ වාර්තාවෙන් අපේ රට මුහුණ දෙන බරපතළ අභියෝග කීපයක් ආමන්ත්‍රණය කර තිබෙනවා. වඩාත් කාර්යක්ෂම හා ඵලදායී කිරීම සඳහා රජය ප්‍රතිව්‍යුහගත කිරීමේ අවශ්‍යතාව අප හඳුනාගෙන තිබෙනවා.

අපේ ආර්ථික ප්‍රතිසංස්කරණ හේතුවෙන් දැඩි ලෙස මධ්‍යගත වූ පාලන ව්‍යුහය වෙනුවට ප්‍රාදේශීය කලාපවල අවශ්‍යතා ආමන්ත්‍රණය කළ හැකි ක්‍රමවේදයක් නිර්මාණය වෙනවා. බලය බෙදීම ප්‍රමුඛතාවක් වන්නේ ඒ නිසායි. උතුරේ සිට දකුණ දක්වා සියලු පළාත්, බලය බෙදීමට සහාය දක්වා තිබෙනවා. ඇත්ත වශයෙන්ම දකුණේ පළාත් සභාවල ප්‍රධාන ඇමතිවරුන් මෙහි ප්‍රමුඛ කාර්ය භාරයක් ඉටු කළා. අපේ විවිධාකාර අවශ්‍යතා කාර්යක්ෂමව ආමන්ත්‍රණය කිරීම සඳහා අවශ්‍ය බලය බෙදා දීමේ මූලධර්මය සකස් කළේ ඔවුන්ගේ නිර්දේශ පදනම් කර ගෙනයි. රජයේ ස්වභාවය ආරක්ෂා කර ගන්නා අතරම පළාත් සභාව වෙත වැඩි බලයක් බෙදා හැරීමෙන් පළාත් මට්ටමේ සංවර්ධනය ක්‍රියාත්මක කරවීම පිණිස රාජ්‍ය පාලනයේ දෙවන තලය නිර්මාණය කිරීම පිළිබඳ වැඩි අවධානයක් යොමු කරන්න අපට හැකි වනවා.

අතුරු වාර්තාවේ ඇතුළත් යෝජනාවල කොටසක් වශයෙන්, පළාත් පාලන ආයතන රාජ්‍ය පාලනයේ තුන්වැනි තලය වශයෙන් හඳුනා ගනු ලබනවා. එමඟින් විවිධ ප්‍රජාවන්හි විශේෂිත අවශ්‍යතා ආමන්ත්‍රණය කිරීමට, ඉලක්ක ගත වියදම් හා විශේෂයෙන් සැකසූ රාජ්‍ය සේවා වඩාත් හොඳින් සැපයීම පහසු කිරීමට බලාපොරොත්තු වෙනවා. මේ සඳහාත් එසේම වාර්තා ඇතුළත් අනෙකුත් යෝජනා බොහොමයකට ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් පුළුල් සහයෝගයක් ලැබීම මට සතුටක්. කෙසේ වෙතත් විධායකය සහ ජනාධිපතිවරයාගේ කාර්ය භාරය නිර්වචනය කිරීමේ කටයුතුවල තවත් නිරාකරණය කරගත යුතු ක්ෂේත්‍ර තිබෙනවා. මේ සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේත්, ජනතාවත් අතර පුළුල් සංවාදයක් අවශ්‍යයි. නමුත් වැඩි කල් නොගොස් ඒ සම්බන්ධයෙන් පොදු එකඟතාවකට පැමිණෙන්න හැකි බව අපට විශ්වාසයි.

මෙම අතුරු වාර්තාව සත්‍ය වශයෙන්ම සාමූහික ප්‍රයත්නයක්. ඊට අදාළ ක්‍රියාවලිය මුළුල්ලේම ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මහතාගේ සහයෝගය ලැබුණා. මෙය, ස්වාධීන කොමිටිවල මාස ගණනාවක පරිශ්‍රමයේ ප්‍රතිඵලයක්. නව ව්‍යවස්ථා කෙටුම්පත් සම්පාදන කාර්යය අධීක්ෂණය කිරීම පිණිස ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයක් පිහිටුවනු ලැබුවේ 2016 මාර්තු 9වැනි දායි. එමඟින් ඒකමතිකව මෙහෙයුම් කමිටුවක් පත් කළා. එමඟින් ප්‍රධාන වැදගත් විෂය ක්ෂේත්‍ර දොළහක් හඳුනා ගත්තා. ඉන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය විසින් ස්වාධීන අනුකමිටු හයක් තෝරා ගත්තා. මෙහෙයුම් කමිටුව විසින් එම අනුකමිටුවලට ප්‍රධාන ක්ෂේත්‍ර හයක් පැවරුවා. අදාළ අනුකමිටු හයේ වාර්තා 2016 නොවැම්බර් 19 වන දින සහ දෙසැම්බර් 10 වන දින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත සභාගත කළා. ඉතිරි විෂය ක්ෂේත්‍ර හයට අදාළ මෙහෙයුම් කමිටුවේ අතුරු වාර්තාව අද සභාගත කළා.

මෙහෙයුම් කමිටුවේ සිට අනුකමිටු දක්වා සෑම මට්ටමකදීම, සාමාජිකයන් තෝරා ගැනීමේදී ශ්‍රී ලාංකිකයන් නියෝජනය වන පරිදි හා සියල්ලන්ම ඇතුළත් වන ක්‍රියාවලියක් බවට තහවුරු වන පරිදි ඉතා ප්‍රවේශමෙන් කටයුතු කළා. ඒ නිසා මෙමඟින් රට පුරා ධනාත්මක පොදු විවාදයක් ඇතිවේ යැයි අපි බලාපොරොත්තු වෙනවා. We want the whole country to debate these proposals. මෙය අපේ ආණ්ඩුව විසින් සංවර්ධනය කර ලබා ගත් ප්‍රගතියක් යැයි අපට ආඩම්බර වන්නට පුළුවන්.

මෙය ඓතිහාසික අවස්ථාවක්. කලක් ඉතා තදින් භේදබින්න වී සිටි රටක පොදු සම්මතියක් ඇති කර ගැනීම සඳහා ආණ්ඩුවත්, විපක්ෂයත් එකතු වුණා. ඒ විතරක් නොවෙයි. එකට එකමුතුව වැඩ කිරීමෙන් අප සියල්ලන්ටම පොදු වූ අරමුණු, ඉලක්ක සහ දැක්මක් ඇති බව වටහා ගත්තා. සියල්ලන්ටම සාමය, සමෘද්ධිය හා ආර්ථික ශක්තිය ගෙන දෙන දැක්මක් ඇති බව වටහා ගත්තා. අපෙන් අනාගතයට උරුම වන්නේ නිදහස් සමානාත්මතාවෙන් යුතු සාමකාමී ශ්‍රී ලංකාවක්; සමෘද්ධියෙන් වර්ධනය වන ශ්‍රී ලංකාවක්; සියල්ලන්ටම යහපත් හෙට දවසක් උදා කරන ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නැඟීම උදෙසා එකමුතුව වැඩ කරන ශ්‍රී ලංකාවක්.

මේ අතුරු වාර්තාවත්, අනුකමිටු හයේ වාර්තා සමඟ විවාදයට ගැනෙනවා. මේවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය තුළ පමණක් නොවෙයි, රට පුරාම පුළුල්ව විවාදයට හා සාකච්ඡාවට ලක් වනු ඇතැයි මා බලාපොරොත්තු වනවා. මොකද, අවසානයේ සකස් විය යුත්තේ මුළු රටටම, සියලු දෙනාටම බලපාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්.

ඉන් අනතුරුව මෙහෙයුම් කමිටුව ව්‍යවස්ථා කෙටුම්පත සකස් කිරීමට ක්‍රියා කරනවා. ව්‍යවස්ථා කෙටුම්පත සකස් කිරීමෙන් පසු මෙහෙයුම් කමිටුව අවසාන වාර්තාව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනවා. මෙය අපේ රටට ඉතා වැදගත් ක්‍රියාවලියක් වන අතර, අප සියලු දෙනාම ඊට සම්බන්ධ විය යුතුයි. මේ ව්‍යවස්ථාවෙන් අපේ රට පරිවර්තනයකට භාජන වන අතර, සමෘද්ධියේ සහ වර්ධනයේ නව යුගයක් මෙයින් සංකේතවත් වේවි.

භේද භින්නවීම්, ගැටුම් සහ ස්වාර්ථය වෙනුවෙන්ම පාලනය ගෙන ගිය ම්ලේච්ඡ නායකත්වයක් නිසා අපේ රට දරුණු ලෙස විනාශ මුඛයට පත්වුණා. අපි බොහෝ දෙනෙකුට දරුවන්, මව්පියන්, ඥාතීන් සහ මිත්‍රයන් අහිමි වුණා. අප රට තුළ පැතිර ගිය බෙදුම්වාදය හා දේශපාලනික ප්‍රචණ්ඩත්වය අපේ ජීවිත මෙන්ම අපේ අනන්‍යතාව පිළිබඳ හැඟීමත් විනාශ කළා. එමඟින් අපි එකිනෙකා උරණ වුණා. බෙදී වෙන්වීම මඟින් අප අපවම දුර්වල කර ගත්තා; අපේ ජාත්‍යන්තර කීර්තියත් විනාශ වුණා.

අප බලයට පත්වුණාට පසු සියලු ශ්‍රී ලාංකිකයන්ට සමාන අයිතියක් ඇතිවන සේ ප්‍රජාතන්ත්‍රවාදය ප්‍රතිස්ථාපනය කර ශක්තිමත් කළා; ජනතාවට නැවතත් ඔවුන්ගේ අයිතිවාසිකම් හා නිදහස ලැබෙන බව තහවුරු කළා; මහජන වාද විවාදවලට දිරි දෙමින්, බියෙන් තොරව රජය විවේචනය කිරීමේ නිදහස මාධ්‍යවලට ලබා දුන්නා. අපි නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කරා සමීප වන විට එහි මූලික කරුණු පාර්ලිමේන්තුව තුළ පමණක් නොව රට පුරා විවාදයට ලක්වේ යැයි බලාපොරොත්තු වෙනවා. මෙය සියල්ලන් එකතු කරගත්, සියල්ලන්ම සම්බන්ධ

ක්‍රියාවලියක්. ශ්‍රී ලංකාවේ සියලුදෙනාටම වැඩදායක ව්‍යවස්ථාවක් ඇති කර ගැනීම සඳහා අප විසින් ප්‍රතිස්ථාපනය කර ගත් නිදහස ඉතා වැදගත්.

සියලුදෙනාටම නිදහසේ මං මාවත්වල ගමන් කිරීමටත්, අපේ දරුවන්ට හොඳ අධ්‍යාපනයක් ලබා දීමටත්, පහසු මිලට මූලික ආහාර ද්‍රව්‍ය මිල දී ගැනීමටත් පහසු වන වාතාවරණයක් ගොඩ නැඟීම සඳහා තවත් කළ යුතු බොහෝ දේ තිබෙනවා. ශ්‍රී ලංකා රජය විසින් පෞද්ගලික ආයෝජන වැඩි වූ, සාධාරණ, යුක්තිසහගත ආර්ථිකයක් ගොඩ නංවනු ඇතැයි ජාත්‍යන්තර ප්‍රජාව තුළ විශ්වාසයක් තිබෙනවා. ශ්‍රී ලංකාව වඩාත් යහපත් අනාගතයකට යන මාවතට යොමු කළ හැක්කේ ආර්ථිකය ශක්තිමත් කිරීමේ අපේ සැලසුම් දැඩි සේ ක්‍රියාත්මක කිරීමෙන් පමණයි.

නව ව්‍යවස්ථාව අපේ ප්‍රගතියේ ඉතා වැදගත් අංගයක්. එය සමාජයේ සියලු සාමාජිකයන් ගැන එක සේ සොයා බලන, ශිෂ්ට සමාජයක මූලධර්මය පදනම් කරගත් එකක්. එයින් අපේක්ෂිත  සමාජය, දුප්පත් හා විපතට පත් විය හැකි ජනතාවගේත් අවශ්‍යතා සම්පාදනය සහතික කරන සමාජයක්. මේ රජය ශ්‍රී ලංකාවේ ජනතාව වඩාත් සවි බල ගන්වන ආකාරයෙන් ඉතා පැහැදිලි බලය බෙදීමක් ක්‍රියාත්මක කරන බවට පොරොන්දු වී තිබෙනවා. එමඟින් ජනතාවට තමන්ගේ ප්‍රජාව සම්බන්ධයෙන් වැඩි හඬක් නැඟීමේ හැකියාව ඇති වනවා. එමෙන්ම ජනතාවත්, රජයත් අතර සමීප බව තවත් වැඩි කරනවා.

අපේ රජය ඡන්දයෙන් පත් වුණේ මින් ඉදිරියට ශ්‍රී ලංකා වාසි ජනතාව සුළු පිරිසකගේ ප්‍රාණ ඇපකරුවන් බවට පත් වන්න කිසිසේත් ඉඩ නොතැබීමේ පොරොන්දුව පිටයි. මින් පසු එවැනි සුළු පිරිසකට අපගේ දරුවන්ගේ අනාගතය සොරා ගැනීමට ඉඩ ලැබෙන්නේ නැහැ. මින් ඉදිරියට අපේ ජීවිත හා පරිසරය බලකාමීන්ගේ කුරිරුකම්වලින් පීඩාවට පත් වන්න ඉඩ ලැබෙන්නේ නැහැ. ඒ පදනම නව ව්‍යවස්ථාවට අන්තර්ගත වනවා. එය, අප ආරක්ෂා කරන ව්‍යවස්ථාවක්; ශක්තිමත් ආර්ථිකයක් ගොඩ නැගීම සඳහා අප කටයුතු කරන විට එයින් ලැබෙන සමෘද්ධිය සියල්ලන් අතර බෙදී යන බව තහවුරු කරන ව්‍යවස්ථාවක්. ඒ නිසා අප සියලුදෙනාගේම අදහස් එක්කොට, නව ව්‍යවස්ථාව සකස් කර එක්සිත්ව හා එක්සත්ව වඩා දීප්තිමත් හා බලගතු ශ්‍රී ලංකාවක් ගොඩනැඟීම සඳහා ඉදිරියට පියවර තබමු.

ගරු සභාපතිතුමනි, මේ සියල්ලම පරිවර්තනය කරන්න ක්‍රියා කළ සියලු නිලධාරින්ට මම ස්තුති කරනවා. අපි බලාපොරොත්තු වෙනවා, ඔක්තෝබර් මාසයේ පාර්ලිමේන්තු රැස්වීම් නැති සතියක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය කැඳවන්න. එසේ කැඳවා මෙය විවාද කිරීමට ඉඩ දෙන්න මම කැමැතියි. ඔබතුමා පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරලා ඒ සඳහා වුවමනා කරන්නේ දවස් දෙකක්ද, තුනක්ද කියා අපට දැනුම් දුන්නාම, අපේ සම්බන්ධීකරණ කමිටුවෙන් ඉතුරු වැඩ ටික කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තුතියි.

මීළඟට, අදහස් ඉදිරිපත් කිරීමේ අවස්ථාව. අපට පෙර වරු 10.25 වෙනකොට මෙම සභාවේ වැඩ කටයුතු නවත්වන්න තිබෙනවා කියන කාරණය මම පළමුවෙන්ම ගරු සභාවේ අවධානයට යොමු කරවනවා.

පළමුවෙන්ම අදහස් ඉදිරිපත් කිරීම, ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன் - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Rajavarothiam Sampanthan - Leader of the Opposition)

Thank you, Mr. Chairman. It is not my intention, Sir, at present to comment on the matters contained in the Interim Report submitted by the Hon. Prime Minister or the annexes tabled therewith. These matters will be dealt with at future meetings of the Constitutional Assembly that will be held for that purpose.

I wish to lay emphasis on the urgent relevance and importance of some aspects of the process that we are engaged in.

We are engaged in the process of making a Constitution for our country, the Democratic Socialist Republic of Sri Lanka. As Sri Lankan Members of Parliament, we, on behalf of the people we represent, are engaged in making the basic Supreme Law of the country - the Constitution.

This is being done within the firm framework of a united, undivided and indivisible Sri Lanka. This is the framework within which the Constitution will be evolved and which all of us will voluntarily acknowledge and accept.

The successful conclusion of the Constitution-making process on the basis of an acceptable, reasonable and substantial national consensus would bring about a firm finality to this issue.

Sri Lanka would perpetually be a united, undivided and indivisible country in keeping with the basic and supreme law of the country and on the basis of the free will and consent of all its people.

Sir, Sri Lanka is a country inhabited by different people with distinct identities: the Sinhalese, the Tamils, the Muslims, the Malays, the Burghers and so on. Sri Lanka is also a functional democracy, in which several political parties function.

While the two main political parties have alternatively formed the Government in this country, other parties too have played their own role.

No Constitution has thus far been framed for Sri Lanka on the basis of a substantial, bipartisan consensus amongst its different people, in particular the Tamil people, or on the basis of such bipartisan consensus between the two main parties and other political parties. The present exercise in Constitution-making  presents the first such opportunity. A Constitution based upon such a reasonable consensus would give the Constitution, the basic and supreme law of the country, a legitimacy and credibility which the country direly needs. This would bring the Constitution out of the realm of political

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

expediency and give the Constitution a character, which would create the ideal of a Sri Lankan identity and a Sri Lankan nation. We have not been able to achieve this in the 70 years since Independence.

Since 1987-1988, Sir, the Constitution-making process has been a continuous process. The Thirteenth Amendment to the Constitution was the first time when power-sharing arrangements between the Centre and the Provinces, however weak, were incorporated in the Constitution. Ever since then, successive Presidents and successive Governments have come up with greatly improved proposals that could contribute towards a final resolution of the national question. During President R. Premadasa’s term, there were the Mangala Moonesinghe Select Committee Proposals; during President Chandrika Bandaranaike Kumaratunga’s term, there were the August 2000 Constitutional Proposals brought to Parliament with Cabinet approval and during President Mahinda Rajapaksa’s term, there were the proposals formulated by the Multi-Ethnic Experts' Committee appointed by him and the Report of the All Party Representatives Committee headed by Prof. Tissa Vitarana submitted to President Mahinda Rajapaksa. I will not go into the details at this juncture. It would be sufficient for me to state that there was a substantial consensus around these proposals, though, for various extraneous reasons, they could not be incorporated into the Constitution**.** The current process, which, in fact, may be termed as a continuation of earlier processes, takes place in an altogether different environment with every possibility of success, if all of us are reasonable and committed not to miss this opportunity.

Reasonable and acceptable constitutional arrangements recognizing their identity and dignity have been a long-standing goal of the Tamil-speaking people. There are many such arrangements the world over. Consequences of non-resolution have had diverse ramifications on the Tamil people and the whole country: educated, qualified citizens of this country, particularly Tamils and Sinhalese, have left this country and taken residence abroad depriving this country of a great deal of talent. The reputation of this country has been greatly tarnished internationally having an adverse impact on the country and its future in several ways. We need to salvage our reputation and win international respect.

Our economy has been greatly handicapped and we have been left behind in the economic field while other countries in the region have progressed steadily enabling the citizens of those countries whose standard of living was lower than ours to enjoy a much higher standard of living than we have in our country. Expenditure of vast sums of money on defence has deprived us of substantial resources for development in several vital areas contributing to backwardness.

All these factors, Sir, make it imperative that we create for our country a new future based upon a new supreme and basic law and that we all jointly endeavour to succeed in the fulfillment of this sacred task.

I thank you, Sir.

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - போக்குவரத்து மற்றும் சிவில் விமானச் சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala De Silva - Minister of Transport and Civil Aviation)

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා, අද දින මෙම ගරු සභාවට ඉදිරිපත් කරන ලද වාර්තාව පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂය වෙනුවෙන් කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදීම වෙනුවෙන්.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් මාගේ සභාපතිත්වයෙන් පත් කරන ලද කමිටුවක් තුළින් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරලා මෙම අතුරු වාර්තාවේ 29 සිට 37 පිටු දක්වා ඇති එක් එක් කරුණු පිළිබඳව ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරය පැහැදිලි කර තිබෙනවා.

ගරු සභාපතිතුමනි, අපි ඉතාම සන්තෝෂ වෙනවා මෙවැනි කාරක සභාවක් තුළදී සියලු දේශපාලන පක්ෂවලට නිදහසේ තමන්ගේ ස්ථාවරය පිළිබඳව දීර්ඝ වශයෙන් සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසා දීම ගැන. ඒ සඳහා ගරු අගමැතිතුමා සුවිශේෂී නායකත්වයක් දුන් බව මම ඉතාම කෘතවේදීව සිහිපත් කරන්නට කැමැතියි.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මේ සභාග රජයට එකතු වුණේ පරමාර්ථ කිහිපයක් ඉෂ්ට කර ගැනීම සඳහායි. ඉන් එකක් තමයි, මේ රටේ මැතිවරණ ක්‍රමය සකස් කර ගැනීම. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුළු එක්සත් ජනතා නිදහස් සංන්ධානයේ සියලුදෙනාම සහයෝගය දුන්නා. එහෙම නැති වුණා නම් එය සම්මත කර ගැනීමට පුළුවන් වෙන්නේ නැහැ. ඉන් පසුව අප විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සම්මත කර දෙන බවට විශේෂ එකඟත්වයකට ආවා. නමුත් එය කර ගැනීමට ලැබුණේ නැහැ.

දැන් ප්‍රාදේශීය සභා මැතිවරණ ක්‍රමය කොට්ඨාස ක්‍රමයේ සම්මිශ්‍රණයකට ඇවිල්ලා තිබෙනවා. ඊයේ පළාත් සභා මැතිවරණ ක්‍රමය සම්මිශ්‍ර ක්‍රමයට පැවැත්වීමට අවශ්‍ය නීති ගෙන ආවා. ඒ වාගේම, පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමයත් වහාම ඒ ක්‍රමයට යන්න ඕනෑය කියන ස්ථාවරය ඉතා පැහැදිලි ලෙස ශ්‍රී ලංකා නිදහස් පක්ෂය -අපි- ඉදිරිපත් කරලා තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මේ ව්‍යවස්ථා සංශෝධනයේදී 1, 2, 3, 4, 5, 6 සහ 8 යන ව්‍යවස්ථා ඒ ආකාරයෙන්ම පවත්වා ගත යුතු බවත්, ඒකීයභාවය පිළිබඳව තිබෙන ව්‍යවස්ථාව ඒ ආකාරයෙන්ම පැවතිය යුතු බවත් අපි විශේෂයෙන් සඳහන් කර තිබෙනවා.

වෙනත් කිසිම පක්ෂයක් විසින් ඉදිරිපත් නොකළ නව අදහස් රාශියක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කළ යුතුය කියා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කියා තිබෙනවා. ඒ, එකක් තමයි, ව්‍යවස්ථාදායක අධිකරණය. ඒක මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් - Supreme Court එකෙන්- පත් කරන අධිකරණයක් වෙන්න ඕනෑ. ඊළඟට Second Chamber එකක් පිළිබඳ අදහසට අපි එකඟයි. ඒ කියන්නේ, දෙවැනි සභාවක් - සෙනෙට් සභාවක්- පිළිබඳ අදහසට. හැබැයි එහි සංයුතියේ වෙනසක් විය යුතු බවට අපි යෝජනා කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ඒ සභාවට වැඩි බලතල ලබා දීම

සඳහා එයින් පත් වන මන්ත්‍රීවරුන් දෙදෙනෙකුට අනිවාර්යයෙන්ම අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යාංශ දෙකක් දිය යුතුයයි අපි යෝජනා කර තිබෙනවා. [බාධා කිරීමක්] ඔව්, සෙනෙට් එකේ දෙදෙනකුට.

ගරු සභාපතිතුමනි, අපි ඉතාම progressive යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. ඒක තමයි අමාත්‍යාංශ ප්‍රමාණය 30කට සීමා කරන්න ඕනෑය, Deputy Ministersලා ගණන 30කට සීමා කරන්න ඕනෑය කියන එක. එපමණක් නොවෙයි, ඒ ඒ අමාත්‍යාංශයේ විෂය පථය වෙනස් කළ නොහැකි ආකාරයේ ක්‍රමවේදයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන්න ඕනෑ. එතකොට ඕනෑ, ඕනෑ විධියට අමාත්‍යාංශවල විෂයයන් වෙනස් කිරීමට පුළුවන්කමක් නැහැ.

ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තුන් කාලය ගැනම කල්පනා කරලා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනවලදී මෙතෙක් අපට අත හැරුණු දේවල් ඇතුළත් කරලා, හොඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා යෝජනා අප ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 9 වන ව්‍යවස්ථාව ඒ ආකාරයෙන්ම පැවතිය යුතුයි ද අප කියා තිබෙනවා.

විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම පිළිබඳව අපේ අදහස් ප්‍රකාශ කරලා තිබෙනවා. යම් ආකාරයක විධායක ජනාධිපති ධුරයක් පවත්වා ගෙන යන්නට ඕනෑ. අපි බලය බෙදීමට විරුද්ධ නැහැ; බලය උපරිම ලෙස බෙදන්න අපි එකඟ වෙලා තිබෙනවා. එවැනි අවස්ථාවකදී රටේ ආරක්ෂාව සඳහා, ඒකීයභාවය රැක ගැනීම සඳහා යන්ත්‍රණයක් හා සියලු ජාතීන්ගේ ඡන්දවලින් පත් වන ජනාධිපතිවරයෙකුගේ අවශ්‍යතාව අපි අවධාරණය කරලා තිබෙනවා. එතකොට තමයි ජාතික සංහිඳියාව, ආගමික සංහිඳියාව ඇති වන්නේ. ජාති වශයෙන් වෙන් වෙලා, ආගම් වශයෙන් වෙන් වෙලා තරග කරන්නේ නැතිව, එක ජනාධිපතිවරයෙක් පත් කිරීමට පුළුවන්කමක් තිබෙනවා. ඒ වාගේම, අගමැතිවරයා පත් කිරීම පිළිබඳව වෙස්ට්මින්ස්ටර් ක්‍රමය උපයෝගී කර ගත යුතු යැයි අපි යෝජනා කරලා තිබෙනවා. මෙවැනි ඉතාම කාලීන, ප්‍රගතිශීලී යෝජනා ගණනාවක් අපි ඇතුළත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම, මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම පිළිබඳව වූ යෝජනාවට ප්‍රමුඛතාව දිය යුතුය යන්න ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ස්ථාවරයයි.

අප මෙතෙක් කල් කාරක සභාව තුළ කරන ලද සාකච්ඡා අපි මේ සභා ගර්භය තුළත් ඇති කරලා, මෙහි තිබෙන යම් යම් වෙනස්කම් හැකිතරම් අඩු කර ගෙන, -මේවා ඒ ආකාරයෙන්ම පැවතිය යුතු ස්ථාවරයන් නොවෙයි- සාකච්ඡාව තුළින්, සම්මන්ත්‍රණය තුළින් අපි ඒවා වෙනස් කර ගෙන, කාටත් එකඟ වන්නට පුළුවන් හොඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කරමු කියා යෝජනා කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
බොහොම ස්තූතියි.

මීළඟට, අනුර කුමාර දිසානායක මැතිතුමා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටු අතුරු වාර්තාව පිළිබඳව කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින්ම ස්තූති වන්ත වනවා.

ගරු සභාපතිතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිබඳව අපට වෙනත් ස්ථාවරයක් තිබෙනවා. ඒ කියන්නේ ඕනෑම රටක, ඕනෑම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඒ කාලයේ නියෝජනය කරමින් තිබෙන සමාජ, ආර්ථික ප්‍රතිපත්තියේ නීතිමය රැකවරණයයි. සමාජ, ආර්ථික ප්‍රතිපත්තියෙන් එහා යන නීතිමය රැකවරණයක් හැදෙන්නේ නැහැ. එම නිසා ප්‍රතිපත්තිමය වශයෙන් ගත්තොත්, මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දැනට අනුගමනය කරමින් තිබෙන සමාජ, ආර්ථික ප්‍රතිපත්තිය සඳහා සකස් කර තිබෙන නීතිමය රැකවරණයක්. එම නිසා අපි මේ සමාජ, ආර්ථික ප්‍රතිපත්ති පිළිගන්නේ නැහැ වාගේම මෙයට ලබාදෙන නීතිමය රැකවරණයත් අපි පිළිගන්නේ නැහැ.

ගරු සභාපතිතුමනි, කෙසේ වුවත් අපි කැමැති වුණත්, අකැමැති වුණත් මේ රටේ ජීවත්වන හැම කෙනාම යටත්වන මූලික ලියවිල්ල බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පත්වනවා. 1978 නිර්මාණය කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට දැන් අවුරුදු 39කට ආසන්න කාලයක් ගත වෙමින් තිබෙනවා. මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අවස්ථා 19කදී සංශෝධනය වෙලා තිබෙනවා. ඒ අවස්ථා 19න් අවස්ථා 2ක් හැරුණුකොට ඉතිරි සෑම අවස්ථාවකදීම සංශෝධනයට ලක් කරලා තිබෙන්නේ, ඒ මොහොතේ බලයේ සිටි පාර්ශ්වයේ බලය තහවුරු කර ගැනීමේ සහ බලය දීර්ඝ කර ගැනීමේ අරමුණින්. එම නිසා මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළ යුතුයි කියන මූලික එකඟතාවක අපි ඉන්නවා. එය මේ සමාජ, ආර්ථික ප්‍රතිපත්ති දේහයෙන් මුළුමනින්ම වෙනස් වුවක් නොවෙයි. එම නිසා මෙය යම් ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණයක් කියන පැත්තෙන්, අපි අපේ දායකත්වය මේ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගොඩ නැඟීම සඳහා ලබාදෙන්න සූදානම්.

ගරු සභාපතිතුමනි, එහිදී ආරක්ෂා විය යුතු යැයි කියා විශ්වාස කරන මූල ධර්ම කිහිපයක් තිබෙනවා. පළමුවන මූල ධර්මය තමයි විධායක ජනාධිපති ධුරය පිළිබඳ ප්‍රශ්නය. ගරු සභාපතිතුමනි, අපි දන්නවා, මිනිස් ශිෂ්ටාචාරය ආරම්භයේදීම රැහේ නායකයකු අත තමයි බලය කේන්ද්‍රගතවෙලා තිබුණේ කියලා. ඒ රැහේ නායකයා තමයි තීරණය කරන්නේ, ඒ රැහේ කවුද ඉන්නේ, ඒ රැහේ කවුද විවාහ වන්නේ, රැහේ අයට දෙන දඬුවම මොකක්ද කියලා. තනි පුද්ගලයකු -රැහේ ගෝත්‍රික නායකයකු- අතේ තමයි ඒ බලය තිබුණේ.

ලෝක ඉතිහාසයේ ඇති වූ ගැටුම්, පරිවර්තනයන්, අත් දැකීම් හරහා තමයි තනි පුද්ගලයෙකු අත කේන්ද්‍ර වී තිබෙන බලයන් යම් මණ්ඩලයන් සහ සභාවන් වෙත පැවරුණේ. එම නිසා තමයි තනි පුද්ගලයෙකු මත තිබුණු බලය පාර්ලිමේන්තුවත්, කැබිනට් මණ්ඩලයත් වෙත පැවරුවේ. එම නිසා 1978 දී ගොඩනඟන ලද විධායක ජනාධිපති ධුරය නිසා සභාවන් වෙත තිබෙන බලය වෙනුවට තනි පුද්ගලයෙකු මත අතිශය විනාශකාරී බලයක් නිර්මාණය වෙමින් තිබුණා. පසුගිය අවුරුදු 39ක කාලය අපි අවුස්සා බැලුවොත් පෙනෙනවා, මෙම තනතුර විසින් රටට ඇති කරන ලද ප්‍රජාතන්ත්‍ර විරෝධී සහ ජනතා විරෝධී ක්‍රියාමාර්ග විශාල ප්‍රමාණයක් තිබෙන බව. එම නිසා මේ පාර්ලිමේන්තුව යලි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් පිළිබඳව අවධානය යොමු කරනවා නම්, විධායක ජනාධිපති ධුරය මෙසේ පවත්වා ගෙන යමින් ප්‍රජාතන්ත්‍රවාදය පුළුල් කිරීම හෝ ජනතාවගේ අයිතීන් සහතික කිරීම හෝ කිසිසේත්ම සිදු වන්නේ නැහැ. මොකද, විධායක ජනාධිපති ධුරය කියන මෙවලම උපයෝගී කර ගෙනම තිබෙන්නේ ප්‍රජාතන්ත්‍රවාදය විනාශ කිරීමට සහ ජනතාවගේ අයිතිවාසිකම් කප්පාදු කිරීම සඳහායි. එම නිසා විධායක ජනාධිපති ධුරය පවත්වා ගැනීමත්, ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂාවත් කියන්නේ එක පීල්ලේ ගමන් කරන කරුණු දෙකක් නොවෙයි. ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් වන්නේ අනිවාර්ය ලෙස විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ මූලික අරමුණ ඉටු කර ගැනීමෙන්

[ගරු අනුර දිසානායක මහතා]

පමණයි. එම නිසා අනිවාර්යයෙන්ම මේ ව්‍යවස්ථාව තුළින් විධායක ජනාධිපති ධුරය අහෝසි විය යුතුය කියන ස්ථාවරයේ අපි ඉන්නවා. විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීම කියන පදනම මත සිට තමයි අපි මේ සාකච්ඡාවන්ට; මේ වාර්තාවන්ට අදහස් හුවමාරු කිරීමට සහභාගි වන්නේ. එය කිසිසේත්ම සාකච්ඡාවෙන් වෙනස් කර ගත යුතු - flexible - කරුණක් ලෙස අපි විශ්වාස කරන්නේ නැහැ. මොකද, මූල ධර්මයක් ලෙසම විධායක ජනාධිපති ධුරය අහෝසි විය යුතුයි.

දෙවෙනි කරුණ තමයි, මැතිවරණ ක්‍රමය. දැන් පළාත් පාලන මැතිවරණ ක්‍රමය වෙනස් කරලා තිබෙන බව අපි දන්නවා. පළාත් සභා මැතිවරණ ක්‍රමය සැබැවින්ම වෙනස් වුණේ ඡන්ද ක්‍රමය පිළිබඳ අභිලාෂයට වඩා වෙනස් අවශ්‍යතාවක් මතයි කියලා අපි කවුරුත් දන්නවා. එතැන තිබුණේ ඡන්ද ක්‍රමය පිළිබඳ අභිලාෂයම නොවෙයි. හැබැයි, පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් වෙනවා නම්, එය වෙනස් විය යුතු වන්නේ ව්‍යවස්ථාව ඇතුළෙන් පමණක්මයි.

ව්‍යවස්ථාවට පිටින් ගෙන එන කිසිදු සංශෝධනයකින් පාර්ලිමේන්තු මැතිවරණ ක්‍රමය වෙනස් කිරීම සඳහා අපි එකඟතාව පළ කරන්නේ නැහැ. එය ව්‍යවස්ථාව ඇතුළෙන්ම වෙනස් විය යුතු කරුණක් ලෙස අප පිළිගන්නවා.

ඊළඟ කාරණය ගරු සභාපතිතුමනි, අපේ රටේ ජනතාව අතර විවිධ භාෂාවන් කථා කරන අය ඉන්නවා; විවිධ සංස්කෘතීන් තිබෙනවා; ඒ වාගේම විවිධ ආගමික පිළිගැනීම් තිබෙනවා. මෙවැනි බහු ජාතික ජාතික රාජ්‍යයක්, අපේ රට. අපේ රට ඒක ජාතික, ජාතික රාජ්‍යයක් නොවෙයි; බහු ජාතික, ජාතික රාජ්‍යයක්. බහු ජාතික, ජාතික රාජ්‍යයක පැවැත්ම රඳා පවතින්නේ සියලු ජන කොට්ඨාසයන්ගේ අයිතිය සාධාරණ සහ සම ලෙස පිළිගැනීමෙන් විතරයි. බහු ජාතික ජාතික රාජ්‍යයක සමගිය රඳා පවතින්නේ නැහැ, පැවැත්ම රඳා පවතින්නේ නැහැ, එක් ජාතියක් තව ජාතියකට වඩා උසස් හෝ එක් සංස්කෘතියක් තව සංස්කෘතියකට වඩා පහළ හෝ එක් භාෂාවක් තව භාෂාවකට උසස් හෝ පහත් කියන සාධක මත. ජාතික සමගිය රඳා පවතින්නේ, සියලු ජන කොට්ඨාසයන්ගේ සංස්කෘතිකමය අයිතීන්, භාෂාමය අයිතීන් සහ ඔවුන්ගේ උරුමයන්ගේ අයිතීන් පිළිගැනීම සඳහා වූ සාධාරණ, සම අයිතිය පිළිගැනීමේ ව්‍යවස්ථාවක් තුළින් විතරයි. එම නිසා ජාතික සමගිය ගොඩ නැඟීම සඳහා අවශ්‍ය වන මූලිකම වෙනස්කම්, තීරණය කිරීමේදී එම ජන කොට්ඨාසයන්ගේ රැකවරණයන් ආරක්ෂා විය යුතු ආකාරයට තීරණය කළ යුතුව තිබෙනවා. ඒ වාගේම ස්වෛරීභාවය, ජාතික ආරක්ෂාව, ජනතාවගේ අයිතිවාසිකම් යන මේවා තමයි ජනතාවගේ පැත්තෙන් ව්‍යවස්ථාවක මූලික කරුණු විය යුත්තේ. ස්වෛරීභාවය, ජාතික ආරක්ෂාව සහ ජනතාවගේ අයිතිවාසිකම් මෙම ව්‍යවස්ථාවේ හරය බවට පත් වියයුතුව තිබෙනවා.

ගරු සභාපතිතුමනි, මෙම ව්‍යවස්ථාව පිළිබඳව අදහස් ඉදිරිපත් කිරීමේදීත්, ව්‍යවස්ථාව සම්පාදනයේදීත් අපි හැම දෙනාම කල්පනා කළයුතු වෙනවා, ජාතිවාදී කෝණයෙන් ව්‍යවස්ථා සම්පාදනයට හවුල් නොවී සිටින්න.

මොකද, මේ ශ්‍රී ලංකාවේ විවිධ ජන කොට්ඨාස ජීවත් වෙනවා. ඔවුන්ගේ ජනතා අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ දිශාවෙන්, විවෘත මනසකින් මෙම සාකච්ඡාවට සහභාගි විය යුතුයි. කිසිදු පාර්ශ්වයක් ජාතිවාදී කෝණයෙන් මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලියට සහභාගි නොවිය යුතුයි; අදහස් ඉදිරිපත් නොකළ යුතුයි කියන ස්ථාවරයේ අපි ඉන්නවා. ඒ වාගේම මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එරෙහිව ගොඩ නැඟෙන සංවාද, විවේචන -මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්පාදනයේදී වාගේම ඊට එරෙහිව ගොඩ නැඟෙන සංවාද- ජාතිවාදී කෝණයෙන් ගොඩ නොනැඟිය යුතුයි කියන ස්ථාවරයේත් අපි ඉන්නවා.

ගරු සභාපතිතුමනි, ඒ නිසා නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් අපේ රට මුහුණ දී තිබෙන ආර්ථික දේහයේ, සමාජ දේහයේ, දේශපාලන දේහයේ ගැඹුරුම, මූලිකම ගැටලුවලට විසඳුම් ලැබෙනවාය කියන මිත්‍යාවට අපි යන්නේ නැහැ. ඒක නිකම් ගෙදර තිබෙන මුව හමට තළනවා වාගේ වැඩක්. ඒ නිසා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සකස් කිරීමෙන් ඒ සියල්ල විසඳෙනවා කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. නමුත් අපේ රටේ ප්‍රජාතන්ත්‍රික අයිතීන්, ජනතාවගේ මූලික අයිතිවාසිකම් සහ සියලු ජනතාවගේ අයිතීන් තහවුරු කිරීම සඳහා යම් ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියක් මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හරහා ලබා ගත හැකියි කියන විශ්වාසය තිබෙනවා. මෙහි අඩංගුව පිළිබඳව ඊළඟට අපි යොදා ගන්නා විවාදවලදී වඩාත් වැඩියෙන් සාකච්ඡා කරන්න පුළුවන්. මූලික වශයෙන් මේ කරුණු ටික තමයි මෙම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදන ක්‍රියාවලිය පිළිබඳව අපට ඉදිරිපත් කරන්න තිබෙන්නේ. ගරු සභාපතිතුමනි, ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු රවුෆ් හකීම් මහතා (නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යතුමා)**

(மாண்புமிகு றவுப் ஹகீம் - நகரத் திட்டமிடல் மற்றும் நீர் வழங்கல் அமைச்சர்)

(The Hon. Rauff Hakeem - Minister of City Planning and Water Supply)

*Bismillahir Rahmanir Raheem.*

Mr. Chairman, on behalf of the Sri Lanka Muslim Congress, I wish to place on record my appreciation as well as that of my Party for the wonderful work that has been done by the Steering Committee in producing an Interim Report to this Constitutional Assembly today. In that regard, our thanks must first go to the Hon. Prime Minister for having taken his valuable time to chair personally this Steering Committee for several weeks, sometimes days at a stretch, in order to bring divergent views into some acceptable compromised formulas as well as to reduce the polarized positions and produce a Report today.

I have been part of constitution-making process in this country since 1989. I have been a Member of the All Party Conference summoned by late President Premadasa and also several Select Committees of Parliament ever since then, except for the Mangala Moonesinghe Select Committee. What is unique in this effort is that, for the first time, the Prime Minister himself is giving committed leadership towards preparing a new Constitution for our country. There is bipartisan participation by all parties present in Parliament. We have given sufficient space for other political parties unrepresented in Parliament and civil society groups to come before us and place their viewpoints regarding constitution-making in this country. So, this is an exercise which has embraced many shades of opinion and therefore, we would say that there is much hope that finally this would come to some fruition. But in the meantime, I must also say that the type of divergence that we now see in variety of positions that have been taken by several parties on critical issues.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

Hon. Minister, we have a little bit of a time constraint. We have three more speakers. So, try to expedite your speech.

**ගරු රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு றவுப் ஹகீம்)
(The Hon. Rauff Hakeem)

Yes, Mr. Chairman.

Critical issues would mean that it is not going to be an easy exercise and it would require much more commitment. Also realizing the need to present a new Constitution in this post-war era for the entire country, all of us can celebrate it as a single document that enshrines our democratic rights and our feeling of a society in which there would not be any discrimination.

There is one particular point regarding which I must state here. We were disappointed to see that in installing supremacy to faith, a simple request to include a provision of non-discrimination has been rejected by some parties. That is a matter of regret for us. Along with that, I must also say that on the electoral process, there is a divergent points of view. Yesterday we saw a very heated Debate in the House. We saw the Vote getting delayed late into the night because there was lack of consensus and it was finally with certain Amendments, we were able to see that the Provincial Councils Elections (Amendment) Bill was pushed through. As I pointed out, there was a lot of faults adopted in the process yesterday, regarding which I have already made my points very clear in previous occasions.

In the meantime, I must also say this, Mr. Chairman. This constitution-making process is a very important attempt and all of us have to come together in supporting it. I must also say that the Secretariat has failed to include some of our observations, particularly our separate observation on electoral reforms as well as certain other points of view that we have wanted to be included in the Report and I would expect the Secretariat to include those.

Thank you.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

The next speaker is the Hon. Douglas Devananda. You have got three minutes. I kindly request you to conclude within that time.

**ගරු ඩග්ලස් දේවානන්දා මහතා**
(மாண்புமிகு டக்ளஸ் தேவானந்தா)
(The Hon. Douglas Devananda)

கௌரவ தவிசாளர் அவர்களே, தமிழ் மக்கள் இலங்கையர்களாக இருக்க வேண்டும் என்பதற்காகத் 'தமிழர்கள்' என்ற அடையாளத்தைக் கைவிடவோ, அல்லது அவர்கள் தமிழர்களாக இருக்க வேண்டும் என்பதற்காக 'இலங்கையர்கள்' என்ற அடையாளத்தைக் கைவிடவோ தயாராயில்லை. அவர்கள் தமிழர்களாகவும் அதேநேரத்தில் இலங்கையர்களாகவும் இருக்கவே விரும்புகின்றார்கள். அதனை அன்று இலங்கையிலிருந்த தமிழ், சிங்களத் தலைவர்கள் சரியாகப் புரிந்துகொள்ளாததன் விளைவே நாட்டை இரத்தத்தில் மூழ்கடித்தது. ஆனால், இன்று இலங்கையர்கள் அதிலிருந்து வெளிவந்துகொண்டிருக் கிறார்கள் என்பதையும் பதிவுசெய்துகொள்ள விரும்புகின்றேன்.

நாம் அரசியலில் தேசிய நீரோட்டத்தில் கலந்துகொண்ட நாளிலிருந்தே "இலங்கை - இந்திய ஒப்பந்தத்தை முழுமையாக நடைமுறைப்படுத்த வேண்டும்" என்ற கோரிக்கையை முன்வைத்து வந்திருக்கின்றோம். அதன் பின்பு இலங்கைச் சமூகங்களுக்கிடையே ஒரு நல்லிணக்கம் ஏற்பட்டுவரும் பொழுது, மேற்கொண்டு அடுத்த கட்டங்களுக்குப் போகலாம் என்பதைத்தான் நாங்கள் நீண்டகாலமாகச் சொல்லி வந்திருக்கின்றோம். இன்று மாண்புமிகு பிரதமர் ரணில் விக்கிரமசிங்க அவர்கள் இதற்காக உண்மைத்தன்மையுடனும் அக்கறையுடனும் செயற்படுகின்றார். அந்த வகையில் அவருடைய முயற்சியால் இன்று வழிப்படுத்தும் குழுவின் இடைக்கால அறிக்கையொன்று சமர்ப்பிக்கப்பட்டுள்ளது.

"மத்தியில் கூட்டாட்சி! மாநிலத்தில் சுயாட்சி!" என்ற அடிப்படையில் நாங்கள் எமது கட்சியின் நிலைப்பாட்டை முன்வைத்துச் செயலாற்றி வந்திருக்கின்றோம். மதக் கோட்பாடு தொடர்பிலும் மேல்சபையில் 50:50 விகிதம், அதாவது சிறுபான்மையின மக்களுக்கு 50 வீதம் கொடுக்கப்பட வேண்டும் என்பதையும் பொலிஸ் மற்றும் முப்படைகளில் இனவிகிதாசாரம் கடைப்பிடிக்கப்பட வேண்டும் என்பதையும் கூறிக்கொள்வதோடு, இது முழுமைபெற மேலும் காலம் இருப்பதால், கிடைக்கின்ற சந்தர்ப்பங்களில் எங்களுடைய கருத்துக்களைத் தொடர்ச்சியாக நாங்கள் வலியுறுத்துவோம் என்றும் தெரிவித்து, சந்தர்ப்பமளித்ததற்கு நன்றி கூறி, விடைபெறுகின்றேன்.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව ඇති කළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුව මාස ගණනාවක සාකච්ඡාවෙන් පසු අතුරු වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. එම වාර්තාවේ සියලු දේශපාලන පක්ෂවල හා කමිටුවේ සාමාජිකයන්ගේ විශේෂ අදහස්, ඉදිරිපත් කරන ලද සංදේශ ඇතුළත් වී තිබීම ඉතාම වැදගත්. ඒ අනුව, ඒකාබද්ධ විපක්ෂය, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, ජාතික හෙළ උරුමය, EPDP, TNA හා ජනතා විමුක්ති පෙරමුණ ඉදිරිපත් කරපු සංදේශ තිබෙනවා. ඒ සංදේශ හා අග්‍රාමාත්‍යතුමා විසින් ඉදිරිපත් කරන ලද අනෙකුත් කරුණු අතර විශාල මත ගැටුමක් හා එකඟ නොවන කරුණු විශාල වශයෙන් තිබෙන බවත් මම සඳහන් කරන්නට කැමැතියි.

ව්‍යවස්ථාවක් සකස් කිරීමේ කාරණයේදී ජනතාවගේ පළල්ම අදහස් නියෝජනය වීමට මේ කමිටුවේ තවම අවස්ථාවක් ලැබුණේ නැහැ. මේ උත්සාහය සුළු පිරිසක් හදා ගත්ත වාර්තාවක් මනසේ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

තබාගෙන දරපු උත්සාහයක් බව ඉතා පැහැදිලි වනවා. දැන් මේ වාර්තාව සභාගත කිරීමේදී, සමස්ත ජනතාවගේ පළල්ම අදහස් මාලාවක් සැලකිල්ලට ගැනීමේ අවශ්‍යතාව මතු වී තිබෙන බව පෙනුණා. එම නිසා අග්‍රාමාත්‍යතුමා ප්‍රකාශ කළා, "ජනතාවගේ අදහස් විමසන්න ඕනෑ." කියලා. ජනතාව කියන්නේ, NGOකාරයෝ නොවෙයි. ජනතාව කියන්නේ, ජනතාව. එයයි ඒකාබද්ධ විපක්ෂය ඉදිරිපත් කරපු නොවෙනස් වන කරුණු 14 තුළ අන්තර්ගත වන කාරණා. මම මේ අවස්ථාවේ ඒ ගැන විවේචනයක් කරන්න උත්සාහ දරන්නේ නැහැ. "ඒකීය රාජ්‍ය" පැවතිය යුතුයි. එය ඉංග්‍රීසි භාෂාවෙන් වෙන නමක්, දෙමළ භාෂාවෙන් වෙන නමක් ලෙස නාඩගමක් ඇති කරන්න කවුරු උත්සාහ දැරුවත් බැහැ. මෙවැනි නාඩගම් මාලාවක් මේ වාර්තාවේ තිබෙනවා. මම ඒවා එකින් එක කියන්න යන්නේ නැහැ. අපි සිංහල දන්නවා; දෙමළ දන්නවා; ඉංග්‍රීසි දන්නවා. ඒකාබද්ධ විපක්ෂය හැටියට අපි චතුකරයේ ජනතාව ඇතුළු මේ රටේ වාසය කරන සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලුදෙනා වෙනුවෙන් ඒකීය රාජ්‍යයක් තුළ ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කර, අපේ රටේ සංවර්ධන මාවත පිළිබඳ ඉතාම පැහැදිලිව, කැපවීමකින් කරුණු කියනවා. අපි පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය පිළි ගන්නවා.

ගරු සභාපතිතුමනි, අවසාන කථාව මට ලබා දීම ගැන මා ස්තුතිවන්ත වෙනවා. ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරුන් 54දෙනකු මා නියෝජනය කරනවා. අපට -ඒකාබද්ධ විපක්ෂයට- කියන්න තිබෙන්නේ, ආණ්ඩුව ප්‍රජාතන්ත්‍රවාදය ගැන මොන කතන්දර කිව්වත්, ප්‍රජාතන්ත්‍රවාදය හා ඡන්ද ක්‍රමය අද මරා දමා තිබෙනවාය කියන එකයි. ප්‍රජාතන්ත්‍රවාදය මරලා, ඡන්ද ක්‍රමය මරලා ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් ගැන ආණ්ඩුව කථා කරනවා. ඒ නිසා මේ රට යළි ඒ පීල්ලට ගෙනෙන්න නම් මහජනතාවගේ ඡන්දය අයිතිය, මහජනතාවගේ මැතිවරණ අයිතිය නැවත ලබා දිය යුතුයි.

ඒ විතරක් නොවෙයි. මහජනතාවගේ අදහස් නියෝජනය කරන පාර්ලිමේන්තුවේ අරගෙන තිබෙන වැරදි තීරණ තුළ මන්ත්‍රීවරුන් 54දෙනකුගේ අයිතිය අහිමි කර තිබෙනවා; හිස ගසා දමා තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ අපට හිමි අයිතිවාසිකම් නොමැති පාර්ලිමේන්තුවක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේයි මමත්, ගරු ප්‍රසන්න රණතුංග මන්ත්‍රීතුමාත් ඉන්නේ. අපි මන්ත්‍රීවරුන් 54දෙනකු නියෝජනය කරනවා. මා ඒක කියන්න ඕනෑ. [බාධා කිරීමක්] නැහැ, ඒක කියන්න මට ඉඩ දෙන්න. මා කරන්නේ විවේචනයක් නොවෙයි. මගේ අදහස් කියන්න මට ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
අපට වේලාව සම්බන්ධයෙන් ගැටලුවක් තිබෙනවා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
මා වැඩිපුර වේලාව ගන්නේ නැහැ.

අනු කමිටු 6ක් පත් කළා. ඒ අනු කමිටුවල අපේ මන්ත්‍රීවරුන්ගේ අදහස් සම්පූර්ණයෙන් කපා හැරියා. ඒ නිසා අනු කමිටු වාර්තා 06ම කාරක සභිකයන් හැටියට හිටපු අපේ මන්ත්‍රීවරුන් ප්‍රතික්ෂේප කළා. අගමැතිතුමා ළඟට අපට මේ පැමිණිල්ල ගෙන යන්න සිද්ධ වුණා. නමුත් ඒක පාක්ෂික, ඒකාධිකාරී ආකාරයෙන් ව්‍යවස්ථාවක් හෝ කෙටුම්පතක් සම්පාදනය කරන්නත් බැහැ. එයයි මම සුවිශේෂව මේ වෙලාවේ රටේ ජනතාව වෙනුවෙන් කියන්නේ. මේ රට ඒකීය රාජ්‍යයක්. සම්බුද්ධ ශාසනය ගැන සඳහන් වෙන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන ව්‍යවස්ථාව මරන්න හදන එකට අපි ඉඩ තියන්නේ නැහැ. සම්බුද්ධ ශාසනයෙන් තමයි, අපේ රජ දරුවන් හරහා තමයි මේ රටේ ඒකීය රාජ්‍යය ආවේ. ඒ නිසා ඒ කාරණා එකින් එක කියන්න මට ඉඩ දෙන්න. ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ හැම දාම මාව නවත්වනවා. නමුත්, මා කියනවා- [බාධා කිරීමක්] කෑ ගහන්න දෙයක් නැහැ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දැන් අවසන් කරන්න වෙනවා, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ඒ නිසා මේ වාර්තාව තුළ- [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු දයාසිරි ජයසේකර ඇමතිතුමා.

**ගරු දයාසිරි ජයසේකර මහතා (ක්‍රීඩා අමාත්‍යතුමා)**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர - விளையாட்டுத்துறை அமைச்சர்)
(The Hon. Dayasiri Jayasekara - Minister of Sports)
ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමාට මා කියන්න කැමැතියි, මේ සභාව නොමඟ යවන ප්‍රකාශ කරන්න ලැහැස්ති වෙන්න එපා කියන එක.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
නොමඟ යවන්නේ නැහැ. ඔබතුමාද දන්නේ? [බාධා කිරීමක්] ඔබතුමා දන්නේ කොහොමද? ඔබතුමා කාරක සභිකයකු නොවෙයි. [බාධා කිරීම්]

මම කථාව අවසන් කරනවා, ගරු සභාපතිතුමනි. [බාධා කිරීම්] මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රධාන ඒකාබද්ධ විපක්ෂයේ මන්ත්‍රීවරු 54දෙනාට හිමි අයිතිවාසිකම් අහෝසි කරලා මොන තරම් කටයුතු කරන්න හැදුවත්,- [බාධා කිරීම්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ඔබතුමාගේ point of Order එක මොකක්ද? නියමිත වෙලාවට අපට මෙම රැස්වීම නවත්වන්න වෙනවා, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මේ රටේ මුස්ලිම් ජනතාව අතර ඒ පිළිබඳ සාකච්ඡා කිරීමේ, - [බාධා කිරීම්] මම තමුන්නාන්සේ ගැන දන්නවා. මම කථා කරනකොට හැම දාම මේක නේ, කරන්නේ. හැම දාම කථානායකතුමා කරන්නේ මට කථා කරන්න දෙන්නේ නැති එකයි.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, ඔබතුමා තවත් වෙලාව ගන්න එපා. දැන් මේ රැස්වීම කල් තියන්න ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මට කථා කරන්න දෙන්න. මම මන්ත්‍රීවරු 54දෙනෙක් වෙනුවෙන් මේ කථා කරන්නේ. ඒ නිසා මට කථා කරන්න දෙන්න. මම කථාව අවසන් කරන්නම්.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

පෙර වරු 10.25ට අපි මේ රැස්වීම අවසන් කරන්න ඕනෑ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මම කථාව අවසන් කරන්නම්. ගරු සභාපතිතුමනි, මම මන්ත්‍රීවරු 54දෙනෙක් නියෝජනය කරනවා.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මම කථා දුන්නේ ඉල්ලපු විධියටයි. ඔබතුමා දැන්, - [බාධා කිරීමක්]

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

මම මන්ත්‍රීවරු 54දෙනෙක් නියෝජනය කරනවා. තමුන්නාන්සේ කවදාවත් මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය තුළ,-

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

Sir, I rise to a point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)

ගරු සභාපතිතුමනි, මම කියන්න කැමැතියි, මේක සිද්ධ වෙන්න ඕනෑ, - [බාධා කිරීමක්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු සභාපතිතුමනි, මම මෙතුමන්ලාට මේ කාරණය මතක් කරන්න ඕනෑ. අපත් Sri Lankan. අපත් මේ බෞද්ධ රටේ අය. මෙතුමන්ලා කියන්න ඕනෑ නැහැ. මතක තියාගන්න 54දෙනෙක් නොවෙයි, ඡන්දය දීමට ඊයේ 37යි නේ, හිටියේ. මොනවාද 54දෙනෙක් ගැන කථා කරන්නේ? [බාධා කිරීම්]

**ගරු මනෝ ගනේසන් මහතා (ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යතුමා )**
(மாண்புமிகு மனோ கணேசன் - தேசிய சகவாழ்வு, கலந்துரையாடல் மற்றும் அரசகரும மொழிகள் அமைச்சர்)
(The Hon. Mano Ganesan - Minister of National Co-existence, Dialogue and Official Languages)

*නැඟී සිටියේය.*
*எழுந்தார்.*
*rose.*

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු මනෝ ගනේසන් ඇමතිතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

Sir, I rise to a point of Order.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

I have to stop at 10.25 a.m. අපට දැන් වෙලාවක් නැහැ, ගරු මන්ත්‍රීතුමනි. 10.25ට අප රැස්වීම නැවැත්විය යුතුයි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

මට කථා කරන්න ඉඩ දෙන්න, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි. [බාධා කිරීමක්] දැන් ඇති.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

දැන් අපට වෙලාවක් නැහැ, ගරු ඇමතිතුමනි.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

මට කථා කරන්න ඉඩ දෙන්න කියා එතුමාට කියන්න, ගරු සභාපතිතුමනි. මගේ අයිතිය උදුරා ගන්න එපා. [බාධා කිරීම්]

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)

ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි, මම ඔබතුමාට අවස්ථාවක් දුන්නා. [බාධා කිරීමක්]

ගරු මනෝ ගනේසන් ඇමතිතුමා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු සභාපතිතුමනි, මම කථා කරන්න හිටියේ වෙන කාරණයක්. නමුත් දැන් මම මේ කාරණය කියන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
(மாண்புமிகு தவிசாளர் அவர்கள்)
(The Hon. Chairman)
ගරු ඇමතිතුමනි, ඔබතුමා ඔය කාරණය විතරක් කියන්න. අපට 10.25ට මේ රැස්වීම නවත්වන්න තිබෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
ගරු සභාපතිතුමනි, මම ඒක දන්නවා.

මමත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ සාමාජිකයෙක්. මම ජාතිය නියෝජනය කරනවා. මට කථා කරන්න අයිතිවාසිකම නැත්නම් ජාතියටම රටේ ඉඩ නැහැ කියා කියන්න ඕනෑ. මෙන්න මේ කාරණය මම පැහැදිලිව කියන්න කැමැතියි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලයේ මෙහෙයුම් කමිටුවේ කොතැනකදීවත් අප තීන්දු ගත්තේ නැහැ, යෝජනාව විතරයි අප සකස් කර ගත්තේ. ඔබතුමා ඒක දන්නවා, ගරු දිනේෂ් ගුණවර්ධන මන්ත්‍රීතුමනි. ඒ නිසා ඔබතුමාට මම මේ කාරණය කියන්න කැමැතියි. අප එකඟතාවට ඇවිත් තිබෙන පළමුවැනි කාරණය මොකක්ද? මේ රටේ බුදු දහමට තිබෙන තැන අහලකින්වත් වෙනස් කරන්නේ නැහැ. ඒ තැන එහෙමම තිබෙනවා.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා (උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல - உயர்கல்வி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Lakshman Kiriella - Minister of Higher Education and Highways and Leader of the House of Parliament)
ගරු සභාපතිතුමනි, "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***ඊට අනුකූලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා මණ්ඩලය පූ.භා. 10.25ට කල් තැබිණ.***

*அதன்படி மு.ப. 10.25 மணிக்கு அரசியலமைப்புச் சபை ஒத்திவைக்கப்பட்டது.*

*Constitutional Assembly adjourned accordingly at 10.25 p.m.*

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.